# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 15 දරන
# මුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 මාර්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

## 1982 අංක 15 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 51/81

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 47 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1982 අංක 15 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 47 දරන මුදල් පනතේ දීර්ඝ නාමයෙහි "පෞද්ගලික රථ" යන වචන වෙනුවට "ඇතැම් මෝටර් වාහන" යන වචන ආදේශ කිරීමෙන් එම දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 47 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටසේ නාමයෙහි "පෞද්ගලික රථ" යන වචන වෙනුවට "ඇතැම් මෝටර් වාහන" යන වචන ආදේශ කිරීමෙන් ඒ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටසේ නාමය සංශෝධනය කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) 2 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියෙහි—

(අ) "1972 නොවැම්බර් මස 10 වන දින දී" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1972 නොවැම්බර් මස 10 වන දින සහ ඉන් පසුව, එහෙත් 1981 මාර්තු මස 23 වන දිනට පෙර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "එකී දිනට පසු පෞද්ගලික රථයක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ මෝටර් වාහනයක පළමුවන අයිතිකරු ලෙස ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තකු ම 3(1) වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි සහ මේ පනත යටතේ ඒ වෙනුවෙන් සාදනු ලබන යම් නියෝගවලට අනුකූලව (මෙහි මින් මතු "අය කිරීම" යනුවෙන් හඳුන්වනු ලබන) අය කිරීමක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1972 නොවැම්බර් මස 10 වන දිනට පසු පෞද්ගලික රථයක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ මෝටර් වාහන

2—ඒ 61740—15,475 (82/02)

යක පළමුවන අයිතිකරු ලෙස ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තකු ම, 3(1) වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි සහ මේ පනත යටතේ ඒ වෙනුවෙන් සාදනු ලබන යම් නියෝගවලට අනුකූලව අය කිරීමක් " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්ති යට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (2) 1981 මාර්තු මස 23 වන දින හෝ ඉන් පසුව හෝ ලියාපදිංචි කරන ලද මෝටර් රථයක එම දිනයෙහි හෝ ඉන් පසුව පළමුවන අයිතිකරු වන සෑම තැනැත්තකු ම, 3(1අ) වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි සහ මේ පනත යටතේ ඒ වෙනුවෙන් සාදනු ලබන යම් නියෝගවලට අනුකූලව අය කිරීමක් ගෙවිය යුතු ය :

එසේ වුව ද, මෝටර් වාහන පනතේ 31(4) වන වගන්තිය යටතේ ආදායම් බලපත්‍ර ගාස්තුවක් ගෙවීමෙන් නිදහස් කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් මේ උපවගන්තියෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය.

මේ උපවගන්තියෙහි සහ 3(1අ) වන වගන්තියෙහ "මෝටර් රථය" යන්නට මෝටර් වාහන පනතෙහි ඇති අර්ථය ම විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි " එම අය කිරීම " යන වචන වෙනුවට " 2(1) වන වගන්තිය යටතේ වූ එම අය කිරීම " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (1අ) 1982 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර දී හෝ වාහනය මෝටර් රථයක් වශයෙන් පළමුවරට ලියාපදිංචි කරනු ලැබූ දින සිට මාස තුනක කාලයක් ගෙවී යාමට පෙර යම් දිනයක දී හෝ යන මෙකී දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ දී 2(2) වන වගන්තිය යටතේ වූ අය කිරීම නියමිත බලපත්‍ර අධිකාරී වෙත ගෙවනු ලැබිය යුතු ය." ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි " (1) වන උපවගන්තිය අනුව එම අය කිරීම ගෙවිය යුතු දිනයෙහි හෝ ඊට පෙර එය ගෙවීම පැහැර හරින " යන වචන සහ ඉලක්කම් වෙනුවට " (1) වන උපවගන්තියෙහි හෝ (1අ) වන

උපවගන්තියෙහි හෝ සඳහන් (මෙහි මින් මතු "අය කිරීම" යනුවෙන් සඳහන් කරනු ලබන) අය කිරීම ගෙවිය යුතු වන දිනයෙහි හෝ ඊට පෙර එය ගෙවීම පැහැර හරින" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "(1) වන උප වගන්තිය අනුව" යන වචන සහ ඉලක්කම වෙනුවට "(1) වන උපවගන්තිය හෝ (1අ) වන උපවගන්තිය අනුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.